Lanka IOC

# Lanka IOC PLC

## ඉන්ධන අලෙවිය සඳහා බෙදුම්කරුවන් (පිරවුම්හල්) පත්කිරීමේ නිවේදනයයි

**පසුගිය කාලපරිච්ඡේදය තුල ලංකා ඉන්දියන් ඔයිල් සමාගම විසින් විවිධාකාර වූ තාක්ෂණික හා සේවා ක්‍රම තුලින් අප පාරිභෝගිකයන් හට නව ආරක අත්දැකීමක් ඉන්ධන පිරවුම්හල තුලදී ලබාදීමට කටයුතු කර ඇත. ජාත්‍යන්තර තත්ත්වයේ ඉන්ධන ශ්‍රී ලංකාවට ලබාදීම උදෙසා අවශ්‍ය ඛනිජතෙල් සැපයීම කෙරෙහි ලංකා IOC කැපවී සිටින අතර ඉන්ධන පිරවුම්හල් ඉදිකිරීම සඳහා සුදුසු ඉඩම් හිමි කාර්ය ශූර, උසස් පාරිභෝගික සේවාවක් සැපයීමට සහ අප සමග ඒ සඳහා අත්වැල් බැඳගැනීමට කැමති පුද්ගලයින්ගෙන් නව ඉන්ධන බෙදාහැරීමේ නියෝජිතයන් ලෙස පත්කර ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

**ඉන්ධන පිරවුම්හල් ඉදිකිරීම සඳහා පහත සඳහන් ස්ථාන ආයතනය විසින් යෝජනා කරනු ලැබේ.**

| අනු අංක | ස්ථානයේ නම | දිස්ත්‍රික්කය | පළාත | ඇස්තමේන්තුගත අලෙවිය (කිලෝ ලීටර) | | |
|---|---|---|---|---|---|---|
| | | | | පෙට්‍රල් | ඩීසල් | එකතුව |
| 1 | යකහටුව හන්දිය (1 Km නුදුරින් කටුනායක සහ වේයන්ගොඩ අතර) | ගම්පහ | | 70 | 100 | 170 |
| 2 | කටාන (වැලිහේන / කටාන පාර සිට ඇත්ගාල වත්ත හන්දිය දක්වා) මීගමුව ගිරිඋල්ල පාරේ සිට වැලිහේන / කටාන පාර හන්දිය | ගම්පහ | | 33 | 40 | 73 |
| 3 | පැලියගොඩ හන්දියේ සිට හැඳල හන්දිය A3 මීගමුව පාර | ගම්පහ | | 150 | 150 | 300 |
| 4 | කිරිඳිවැල, හංවැල්ල පාර, (B - 146) මාලිගාවත්ත ප්‍රදේශය | ගම්පහ | | 120 | 200 | 320 |
| 5 | මිනුවන්ගොඩ හන්දියේ සිට නයිවල දෙසට (B - 208) පාර | ගම්පහ | බස්නාහිර | 150 | 100 | 250 |
| 6 | පානදුර හිරණ පාර, තන්තිරිමුල්ල | කළුතර | | 50 | 90 | 140 |
| 7 | රාජගිරිය සහ නුගේගොඩ අතර නාවල පාර 176 බස් මාර්ගය | කොළඹ | | 200 | 100 | 300 |
| 8 | කොළඹ මහනගර සීමා බල ප්‍රදේශය | කොළඹ | | 300 | 200 | 500 |
| 9 | අඹතලේ පාර, සේදවත්ත අසල (AB 10) | කොළඹ | | 100 | 150 | 250 |
| 10 | හොරණ සිට පිළියන්දල පාර (B 84) | කළුතර | | 120 | 200 | 320 |
| 11 | ගලහ පාර, හඳවලපිටිය, උප තැපැල් කාර්යාල ප්‍රදේශය (හේවාහැට) | නුවරඑළිය | | 33 | 40 | 73 |
| 12 | ලීයන්වල බෑංක් සයිඩ් පාර, හරස්බැද්ද බස්නැවතුම්පොල ප්‍රදේශය | නුවරඑළිය | | 33 | 40 | 73 |
| 13 | නුවරඑළිය මහනගර සීමා බලප්‍රදේශය | නුවරඑළිය | | 100 | 100 | 200 |
| 14 | හඳවලපිටිය උප තැපැල් කාර්යාලය ප්‍රදේශය | නුවරඑළිය | | 26 | 50 | 76 |
| 15 | වලපනේ නගරය | නුවරඑළිය | මධ්‍යම | 80 | 150 | 230 |
| 16 | ගම්පොල, නුවරඑළිය පාර, අටබාගේ | නුවර | | 40 | 50 | 90 |
| 17 | පිළිමතලාව හන්දියේ සිට 6 වන කිලෝමීටර් කණුවේ A5 පිළිමතලාව | | | | | |
| | පේරාදෙණිය ගම්පල මාර්ගය අතර | නුවර | | 100 | 150 | 250 |
| 18 | ඇල්වල හන්දිය සිට වත්තේගම (B - 462) | මාතලේ | | 100 | 150 | 250 |
| 19 | දන්දෙණිය හන්දිය | මාතර | | 33 | 40 | 73 |
| 20 | ඌරුබොක්ක ටවුමේ සිට කොටපොල හන්දිය (B - 606) පාර | මාතර | | 50 | 60 | 110 |
| 21 | මිහිරිපැන්න ප්‍රදේශය | ගාල්ල | දකුණ | 105 | 125 | 230 |
| 22 | සූරියවැව, අම්බලන්තොට පාර | හම්බන්තොට | | 100 | 150 | 250 |
| 23 | පුත්තලම, අනුරාධපුර, ත්‍රිකුණාමල අධිවේගී පාර/පහළ මාහගගවෙල ප්‍රදේශය සම්බන්ධ වන ඕට්ටප්පුව තිඹිරිවැව පාර. | අනුරාධපුර | | 60 | 100 | 160 |
| 24 | මැදවච්චිය හොරොව්පතාන පාර (B282, (B538 මාරුවන ප්‍රදේශය) | අනුරාධපුර | | 72 | 100 | 172 |
| 25 | සියඹලාගස්වැව ප්‍රදේශය (A9 පාර) | අනුරාධපුර | උතුරුමැද | 66 | 72 | 138 |
| 26 | කැබිතිගොල්ලෑව හන්දිය, (A29 පාර සහ B211) | අනුරාධපුර | | 85 | 125 | 210 |
| 27 | මහාබලන්කුලම, පුත්තලම් පාර, අනුරාධපුර (A 12) | අනුරාධපුරය | | 60 | 100 | 160 |
| 28 | දලුක්කන දිඹුලාගල දිඹුලාගල අසල (AB 44) | පොළොන්නරුව | | 80 | 150 | 230 |
| 29 | ඇටම්පිටිය නගර සීමාව (A5 පාර සහ B43) | බදුල්ල | | 60 | 105 | 165 |
| 30 | කුඩා ඔය පාර (A2 පාර කුඩා ඔය පාලම පෙදෙස) | මොණරාගල | ඌව | 60 | 105 | 165 |
| 31 | බුත්තල ඔරලෝසු කණුවේ සිට කතරගම කි.මී. 5 දක්වා (B - 35) පාර | මොරණරාගල | | 60 | 80 | 140 |
| 32 | උඩවලව ප්‍රදේශය (B - 427) පාර | මොණරාගල | | 80 | 120 | 200 |
| 33 | පේදුරු තුඩුව - මරතන්කේනිය පාර (ආම්පන් ප්‍රදේශය) මුරුහන් පාර කෝවිල් ප්‍රදේශය | යාපනය | | 40 | 72 | 112 |
| 34 | මාන්කුලම් - මුලතිව් අධිවේගී පාරේ, කරුප්පඩමුරිප්පු | මුලතිව් | | 26 | 52 | 78 |
| 35 | මන්නාරම පාර, පූවර්සකුලම් කෝවිල් ප්‍රදේශය | වව්නියාව | | 33 | 60 | 93 |
| 36 | යාපනය පොන්නාලෙයි - පේදුරු තුඩුව පාර හන්දිය | යාපනය | | 40 | 72 | 112 |
| 37 | නෙල්ලිඅඩි හන්දිය අසල, පේදරුතුඩුව පාර, යාපනය | යාපනය | | 20 | 40 | 60 |
| 38 | මනිපායි පාර, අන්නයි කොඩෙ හන්දිය (AB 17) | යාපනය | උතුර | 60 | 120 | 180 |
| 39 | පරන්තන් නගර සීමාව | කිලිනොච්චිය | | 50 | 100 | 150 |
| 40 | කිලිනොච්චිය | කිලිනොච්චිය | | 100 | 120 | 220 |
| 41 | පලෙයි A9 පාර, කරන්ඩිකුලම් අසල (A 9) | කිලිනොච්චිය | | 52 | 72 | 124 |
| 42 | කිලෝමීටර් 247 සහ 261 කණු අතර A9 පාර කිලිනොච්චියට යාබද ප්‍රදේශය | කිලිනොච්චිය | | 100 | 200 | 300 |
| 43 | නාවක්කුලි - කරෙයිතිව් මන්නාරම පාර, වෙල්ලම්කුලම් හන්දියේ සිට මුත්තරම්පිටි හන්දිය දක්වා | මන්නාරම | | 52 | 100 | 152 |
| 44 | දම්බොක්ක - රඹුක්කන (B 87) පාර | කුරුණෑගල | | 80 | 150 | 230 |
| 45 | පොල්පිතිගම (B 151) | කුරුණෑගල | වයඹ | 80 | 100 | 180 |
| 46 | දිවුල්ලෑව මාහෝ - මහගල්ල පාර (B 26) | කුරුණෑගල | | 60 | 120 | 180 |
| 47 | රඹුක්කන නගරය | කෑගල්ල | සබරගමුව | 100 | 150 | 250 |
| 48 | ඕපනායක (කොළඹ - මඩකලපුව පාර) (A - 4) | රත්නපුරය | | 100 | 190 | 290 |
| 49 | කාරතිව්, අම්පාර පාර, සමන්තුරේ (A - 31) | අම්පාර | නැගෙනහිර | 60 | 80 | 140 |

බෙදුම්කරුගේ හිමිකාරිත්වයට සතු ඉන්ධන පිරවුම්හල් වෙනුවෙන් අංක 1 සිට 49 දක්වා අදාල කරුණු

තෝරාගත් බෙදුම්කරු විසින්ම ලබාදෙන ඉඩමෙහි ඉන්ධන පිරවුම්හල ඉදිකිරීමට උවමනා යටිතල පහසුකම් සැපයීම අපේක්ෂා කෙරේ. ඒ අනුව, බෙදුම්කරුට හිමි ඉන්ධන පිරවුම්හලට අදාල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමෙහිලා සමාගම සහ තෝරාගත් බෙදුම්කරු එක්ව සිදුකල යුතු කාර්යයන් මෙසේය.

**බෙදුම්කරුගේ කාර්ය භාරය**

1. අයදුම්කරු විසින් පැහැදිලිවම ඉඩමේ අයිතිය තහවුරු කළයුතුය.
2. බෙදුම්කරු විසින් පොළොව සමතලා කොට පස තද කර තිබිය යුතුය.
3. සිමෙන්ති ගල් (pavers) ඇතිරූ ධාවන මගක් ඉදි කිරීම.
4. කැනපිය ඉදි කිරීම.
5. කාර්යාල ගොඩනැගිලි, වැසිකිලි/පවිත්‍රතා කාමර ඉදිකිරීම.
6. ඉඩම වටා තාප්පය ඉදිකිරීම.
7. වායු පහසුකම්, වීදි ලාම්පු සැපයීම සහ භූගත පොම්ප ස්ථාපිත කිරීම.
8. සමාගම විසින් තීරණය කරන වෙනත් පහසුකම්.
9. සමාගම සමග බෙදුම්කාරිත්ව ගිවිසුම අත්සන් කිරීම.
10. අදාල ඉඩමේ ඉන්ධන පිරවුම් හලක් ඉදිකිරීමට අදාල පළාත්පාලන ආයතනයේ අනුමැතිය ලබාගැනීම.

**ඉහත සඳහන් පහසුකම් ලංකා ඉන්දියන් ඔයිල් සමාගමේ පිරිවිතරයන්ට අනුකූලව විය යුතුය.**

**සමාගමේ කාර්ය භාරය**

1. ප්‍රධාන සංඥා කුළුණු, භූගත පෙට්‍රල් සහ ඩීසල් ටැංකි සහ ඉන්ධන පොම්ප සැපයීම සහ ස්ථාපිත කිරීම
2. දැන්වීම් පුවරු සහ සමාගම විසින් තීරණය කරන වෙනත් අවශ්‍ය දෑ සැපයීම සහ ස්ථාපිත කිරීම

**ඉඩම් අවශ්‍යතාවය**

ඉහත සඳහන් ස්ථානවල ඉඩම් ඇති ඉඩම් හිමියන් / බදුකරුවන් හෝ ඔවුන්ගේ ආසන්න ඥාතීන් පෙට්‍රල් / ඩීසල් පිරවුම්හල් ඉදිකිරීම සඳහා ආරාධනා කරනු ලැබේ. අවම බිම් ප්‍රමාණය වනුයේ අඩි 120ක් මුහුණත සහිතව සහ අඩි 100 ක් පළල ඉඩමක් විය යුතුය. සමාගම විසින් ඉතාමත් සුදුසු ස්ථානයක පිහිටා ඇති මෙම කාර්යයට සුදුසුයැයි හැගෙන කුඩා බිම් කොටස් පිළිබඳවද සැලකිල්ල යොමු කෙරේ. අදාල ඉඩමේ අයිතිය තහවුරු කරන ලියවිලි සහ ඉදිරිපත් කරන කොන්දේසි සමග අයදුම්කරු විසින් ලියවිලි ඉදිරිපත් කල යුතුවේ. ඉහත දැක්වෙන පරිදි ඉදිරිපත් කරන ඉඩම් තුල මෙම ව්‍යාපාරය සඳහා වඩාත් උචිත ස්ථානය තෝරාගැනීමේ අයිතිය සමාගම සතුවේ.

අයදුම්කරුට ඉඩමේ අයිතිය නොමැති නම්, එම ඉඩම අයිතිකරු විසින් අයදුම්කරුට/සමාගමට විකිණීමට හෝ අවම වසර 15 ක දීර්ඝ කාලීන බද්දට දීමේ ගිවිසුමකට එළඹ තිබිය යුතු අතර එම ගිවිසුමේ පිටපතක් අයදුම්පත සමග අමුණා එවිය යුතුය. එවැනි අවස්ථාවල අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත්වීමෙන් අනතුරුව තෝරා ගැනීමට සුදුසුකම් ලබන්නේ නම්, අදාල ඉඩම අයදුම්කරු විසින් දීර්ඝ කාලීන බදු ගිවිසුමකට හෝ සින්නක්කර ගිවිසුමකට යටත් කළ යුතුවේ.

බෙදුම්කරු විසින් අයිතිය දරණ පිරවුම්හල් සඳහා සමාගම සහ බෙදුම්කරු අතර බදු ගිවිසුමක් ඇති නොවේ. කෙසේ වෙතත් අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ඉඩමේ හිමිකම පිළිබඳව තහවුරු කිරීම ලියවිලි මගින් කළයුතුවේ. කෙසේ නමුත් දෙපාර්ශවයටම එකගවිය හැකි කොන්දේසි සහ රෙගුලාසි යටතේ, ඕනෑම ස්ථානයක් සමාගම සතු ඉන්ධන පිරවුම්හලක් බවට පත්කිරීමේ අයිතිය සමාගම සතුය.

**අවශ්‍ය මුදල් ප්‍රතිපාදන:**

ඉඩමෙහි වටිනාකම හැර, අයදුම්කරු විසින් ඉන්ධන පිරවුම්හලෙහි යටිතල පහසුකම් සංවර්ධනය උදෙසා දැරීමට සිදුවන අපේක්ෂිත ආයෝජන මුදල රුපියල් මිලියන 20 කි.

**අයදුම්කරුගේ සුදුසුකම්**

අයදුම්කරු විසින් පහත සදහන් සුදුසුකම් සපුරාලිය යුතුය.

1 අ වයස - අයදුම්කරන දිනට වයස අවුරුදු 21කට නොඅඩුවිය යුතුයි.
 ආ ජාතිය - ශ්‍රී ලාංකිකයෙකු වීම
 ඇ අධ්‍යාපනය - අවම වශයෙන් අ.පො.ස-සා/පෙළ සමත් විය යුතුය.
 ඈ අයදුම් ප්‍රතිපත්තිය - ඒක පුද්ගල හෝ සමාගම් යටතේ ලංකා ඉන්දියන් ඔයිල් පිරවුම්හල් තුනක් හෝ ඊට වැඩි ගණනක් බෙදුම්කාරිත්වය දරන්නේ නම් මේ සඳහා ඉල්ලුම් කළ නොහැක.

අයදුම්කරු අපරාධමය වරදකට හෝ අවිනීත හැසිරීමකට භාජනය වී නොතිබිය යුතුයි.

ආසන්න ඥාතීන් අර්ථ නිරූපනය

ඉඩම් හිමියා විසින් සුදුසුකම් සපුරාලන්නේ නොමැති නම් හෝ අයදුම්කරු බෙදුම්කරුවකු වීමට මැලි වන්නේ නම් ඔහුගේ ආසන්නතම ඥාතියෙකුට මේ සදහා ඉල්ලුම්කල හැකිය.

උදා - කාලත්‍රයා, දෙමාපියන්, දරුවන්, තමන්ගේම සහෝදරයන් සහ සහෝදරියන්ට බෙදුම්කාරිත්වය සදහා ඉල්ලුම්කල හැකිය. ආසන්නතම ඥාතීන් අයදුම්කරුගේ සුදුසුකම් සපුරාලිය යුතු අතර ඉඩම් අයිතිකරුගේ කැමැත්ත පිළිබඳ ලිපියක්ද, ඉඩම් හිමිකරුට ඇති ඥාති සම්බන්ධය තහවුරු කිරීම සදහා ලියවිලිද ඉදිරිපත් කලයුතුය.

හවුල් ව්‍යාපාර / සීමිත සමාගම් / සමුපකාර සමිති

හවුල්කරුවන්/බදුකරුවන් හවුල් ව්‍යාපාරයක් ලෙස අයදුම්කරන්නේ නම් සෑම හවුල්කරුවෙක්ම අයදුම්කරුගේ සුදුසුකම් සපුරාලිය යුතුවේ. ඔවුන් තනි තනිව අයදුම්පත් සම්පූර්ණකොට එකට ගොනුකොට තනි ලිපි කවරයක් තුල අයදුම්පත්‍රය ඉදිරිපත් කලයුතුවේ. ඉඩම් හිමියන්, ආසන්නතම ඥාතීන් ඉඩමේ හිමිකරුවන් නොවුනද, බෙදුම්කරුගේ හවුල්කරුවෙකු ලෙස පත්කරගැනීමට කැමතිනම් ඔවුනටද මෙම ශිර්ෂය යටතේ අයදුම් කිරීමට අවශ්‍ය වන්නේ නම් ඔවුන් වෙන වෙනම අයදුම්පත් පුරවා එකට ගොනු කොට එකම ලියුම් කවරයක් තුල බහා අයදුම්පත්‍රය ඉදිරිපත් කල යුතුය. සුදුසු ඉඩම් ඇති සීමිත සමාගම් සහ සමුපකාර සමිති වලටද අයදුම්පත්‍ර ඉදිරිපත් කලහැකි වේ.

**වෙනත් නියමයන් සහ කොන්දේසි**

අ. බෙදාහරින්නෙකු වශයෙන් තෝරාගත් අයදුම්කරු ක්‍රියාකාරී බෙදුම්කරුවෙකු විය යුතු අතර පෞද්ගලිකවම එදිනෙදා වෙළෙඳ කටයුතු පිළිබඳව අවධානය යොමුකොට ව්‍යාපාරය කළමනාකරණය කලයුතුවේ. ඔහු/ඇය වෙනත් රැකියාවක් නොකළ යුතුය.

ආ. බෙදුම්කරු විසින් අවම වශයෙන් දින තුනකට අදාල පෙට්‍රල් සහ ඩීසල් තොග ගබඩා කලයුතු අතර තවද සමාගම විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ලිහිසි තෙල් තොගද ප්‍රමාණවත් ලෙස පවත්වාගෙන යා යුතුය.

ඇ. තෝරාගන්නා ලද අයදුම්කරුවන් රුපියල් මිලියන පහක (5,000,000) මුදලක් ලංකා ඉන්දියන් ඔයිල් සමාගම නමට ලියූ බැංකු අණකරයක් මගින් තැන්පත් කළ යුතුවේ. මෙය පිරවුම්හල ඉදිකිරීමට ප්‍රථම ලබාදිය යුතු අතර මෙම ආරක්ෂිත තැන්පතුව ගිවිසුම අවලංගු කිරීමකදී හෝ ව්‍යාපාර කටයුතු අවසන් කිරීමකදී නැවත ලබා ගත හැක. මෙම ආරක්ෂිත තැන්පතු සඳහා පොලී ගෙවීමක් සිදු කරනු නොලැබේ.

ඈ. තෝරාගත් අයදුම්කරුට බෙදුම්කාරිත්වය දැරීමට අවශ්‍ය අරමුදල් සමාගම සෑහීමට පත්වන ආකාරයට තිබිය යුතුය.

ඉ. අයදුම්කරු මනා මානසික හා ශාරීරික තත්වයේ සිටිය යුතුයි.

ඊ. පහත සදහන් මූලික පහසුකම් සෑම බෙදාහරින්නෙකු විසින්ම සපයාගත යුතුය.

පානීය ජලය, අවශ්‍ය මූලික ඖෂධ සමග ප්‍රථමාධාර පෙට්ටියක්, විශිෂ්ඨ පාරිභෝගික සේවාවක්, අවශ්‍ය ප්‍රමාණයට විදුලි පහන්, දුරකථන පහසුකම්, ප්‍රමාණවත් ධාරිතාවෙන් යුත් ඩීසල් ජෙනරේටරයක්, වැලි බාල්දි සහ ගිනි නිවන උපකරණ ආදී ආරක්ෂිත උපකරණ.

**සාමාන්‍ය නියමයන් සහ කොන්දේසි**

1. අයදුම්කරුවන් www.lankaioc.com යන වෙබ් අඩවියෙන් අයදුම්පත්‍රය බාගත කළ හැකි අතර ලංකා ඉන්දියන් ඔයිල් ප්‍රධාන කාර්යාලයෙන්ද උදේ 9.00 සිට 5.00 දක්වා (සඳුදා සිට සිකුරාදා) අයදුම්පත් ලබාගත හැක.
2. අයදුම්කරුවන් සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමග රු. 2000 ක් වටිනා ලංකා ඉන්දියන් ඔයිල් නමට පිළිවෙල කරන ලද බැංකු අණකරයක් මගින් ඉදිරිපත් කළ යුතුය.
3. අයදුම්කරු විසින් ඇමුණුම "අ" සඳහන් කර ඇති අයදුම්පත්‍රය සම්පූර්ණ කර අදාල ලිපිලේඛණ සමග ඉදිරිපත් කළ යුතුය.
4. අයදුම්කරු විසින් ඇමුණුම "ආ" සඳහන් කර ඇති තොරතුරු ලේඛණය පරික්ෂා කර එය සලකුණුකොට, එය පළමු පිටුව ලෙස අයදුම්පත සමඟ ඉදිරිපත් කලයුතුවේ.
5. මෙම දැන්වීම අවලංගු කිරීම, සංශෝධනය කිරීමට හෝ අස්කරගැනීමට සමාගමට හිමිකම් ඇති අතර අයදුම්පත් භාරගන්නා දිනය කල් දැමීම කිසිදු හේතුවක් නොදක්වා සමාගමේ අභිමතය මත කලහැකි වේ.
6. අයදුම්පත්‍රය ඉදිරිපත් කලපසු එකතු කිරීම් වෙනස් කිරීම් කපා හැරීම් කල නොහැක.
7. තැපැල් ප්‍රමාද මත නියමිත දිනයට පසු ලැබෙන අයදුම්පත් හා නියමිත වලංගු ලිපිද්‍රව්‍ය වලින් තොරව හෝ වෙනත් කරුණක් මත අසම්පූර්ණ ලෙස ඉදිරිපත් කරන අයදුම්පත් සලකා නොබලන අතර ඒ සඳහා ලංකා ඉන්දියන් ඔයිල් සමාගම කිසිදු ප්‍රතිචාරයක් දක්වනු නොලැබේ.
8. ඇමුණුම "ඇ" හි දක්වන දිවුරුම් ප්‍රකාශයේ මුල් පිටපත අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කලයුතුය. සියලු ලිපිලේඛණ/ සහතික පත්‍ර තමා විසින්ම සහතික කරන ලද පිටපත් සමඟ අයදුම්පත්‍රයට ඇමිණිය යුතුය. ලිපිලේඛණවල හා සහතික පත්‍රවල මුල් පිටපත්, සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබුවහොත් එය පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත් කළයුතුය.
9. ස්ථාන කිහිපයක ඉන්ධන පිරවුම්හල් පවත්වාගෙන යාමට ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් වෙන වෙනම අයදුම්පත්‍ර ඉදිරිපත් කළයුතුය.
10. අයදුම්කරු විසින් අයදුම්පත්‍රයේ දක්වන ලද කිසියම් ප්‍රකාශයක් හෝ ලියවිල්ලක් අසත්‍ය හෝ වැරදි සහගත බව සනාථ වුවහොත් හේතු දැක්වීමකින් තොර එම අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලබන අතර, තවද අදාල අයදුම්කරු ඉන්ධන බෙදාහරින්නකු ලෙස පත් කර ඇති විට එම බෙදාහැරීමේ නියෝජිතභාවය අවසාන කරන අතර එහිදී ලංකා ඉන්දියන් ඔයිල් සමාගමට විරුද්ධව කිසිදු අලාභයක් අයකරනු ලැබීමට අයිතියක් නොමැත.
11. සම්පූර්ණ කරන ලද අයදුම්පත බහාලන කවරයෙහි ,පෙට්‍රල් /ඩීසල්, බෙදාහැරීමේ නියෝජිකත්ව අයදුම්පත ........................ස්ථානය ලෙස සටහන් කළ යුතුය.
12. බෙදුම්කරුවෙකු ලෙස තෝරාගැනීමෙන් අනතුරුව පත්වීමේ ලිපිය නිකුත් කිරීමෙන් පසු අදාල බෙදුම්කරු විසින් ලංකා ඉන්දියන් ඔයිල් සමාගමේ කොන්දේසි ප්‍රකාරව ලංකා ඉන්දියන් ඔයිල් සමාගම සමඟ ගිවිසුමකට එළැඹිය යුතුයි.
13. මෙය ව්‍යාපාරික කර්ථවයක් මිස ලංකා ඉන්දියන් ඔයිල් සමාගමේ රැකියාවක් සදහා අයදුම්පත්‍රයක් නොවන අතර සාමාන්‍ය ව්‍යාපාරික අවදානම් සහ ලාභ අලාභ සම්බන්ධව ආයතනය වගකියනු නොලැබේ.
14. මෙම දැන්වීම අයදුම්පත්‍රයක් මිස බෙදාහැරීමේ නියෝජිකත්වයක් ලබාදීමක් නොවන බව සලකන්න.
15. නියෝජිතභාවය සදහා වන අවසාන තෝරාගැනීම අයදුම්කරුවන් ඉදිරිපත් කරන ලිපිලේඛණ වල හා අවසාන සම්මුඛ පරීක්ෂණය මත වන ඇගයීම පදනම් කොටගෙන සිදුකරනු ලැබේ.
16. ලංකා ඉන්දියන් ඔයිල් සමාගම කිසිදු මුදල්මය ගෙවීමක් බාරගනු නොලැබේ. තවද ලංකා ඉන්දියන් ඔයිල් සමාගම අනෙකුත් ක්‍රමවේදයන් වන බැංකු අණකර, චෙක්පත් සහ වෙනත් ආකාරයේ අයකිරීමක්, බලපත්‍ර නිකුත් කිරීමක් ඉන්ධන හලක් පවත්වාගෙන යාමේ බෙදුම්කාරිත්වයක් සඳහා අයකරන්නේ නැත.
17. ආරක්ෂක තැන්පතුවක් සඳහා බැංකු අණකරයක් ලංකා ඉන්දියන් ඔයිල් සමාගම යන නමින් ඉන්ධනහල ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීමට පෙර තැන්පත් කිරීමට අවශ්‍ය වේ.
18. ලංකා ඉන්දියන් ඔයිල් සමාගම කිසියම් හෝ ආකාරයෙන් තනි පුද්ගලයෙකු හෝ ඒක පුද්ගල නිලධාරියෙකුගේ තනි මතය මත බෙදුම්කාරිත්ව බල පත්‍රයක් නිකුත් කරනු නොලැබේ. බෙදුම්කාරිත්වයක් නිකුත් කරනු ලබන්නේ නම් සිව් පුද්ගල කමිටුවක් මගින් කරනු ලබන සම්මුඛ පරීක්ෂණයකින් පසුවය. එය ආයතන ප්‍රධානින් මගින් කරනු ලැබේ.
19. ඉහත සඳහන් ආකාරයට පමණක් බෙදුම්කාරිත්වය ලබාදීම ලංකා ඉන්දියන් ඔයිල් සමාගම මගින් සිදුකරනු ලබයි. තවද ලංකා ඉන්දියන් ඔයිල් සමාගම කිසිදු බලයක් හෝ වගකීමක් කිසිදු පුද්ගලයෙකුට, ඉල්ලුම්කරු සමග කිසිදු ගනුදෙනුවක් හෝ වෙනත් ආකාරයේ ගිවිසුමකට හෝ මූල්‍යමය ගනුදෙනුවකට, බෙදුම්කාරීත්වයක් සඳහා ඉහත කී ක්‍රමවේදයන් හැර බලය ලබාදී නොමැති. එබැවින් බෙදුම් කාරිත්වයක් ලබාදීම සඳහා ඉහත සඳහන් මූල්‍යමය හෝ වෙනත් ආකාරයේ ගනුදෙනු සඳහා කිසිම වගකීමක් දරනු නොලැබේ.
20. පෙර අයදුම්කර ඇති අයදුම්කරුවන් තම ස්ථානය සඳහා නැවතත් අයදුම් කිරීම අත්‍යාවශය වේ.
21. ඔබට තවදුරටත් තොරතුරු දැනගැනීමට අවශ්‍ය නම් ලංකා ඉන්දියන් ඔයිල් සමාගමේ ප්‍රධාන කාර්යාලයේ අලෙවි කළමනාකරු උදේ 9.00 ත් සවස 5.00 ත් අතර වැඩකරන දිනයන්හිදී 0112475720/ 0759278015 යන අංකයන්ගෙන් ලබාගත හැක.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය**

සියලු ලිපිලේඛණ අමුණාන ලද සම්පූර්ණ කරන ලද අයදුම්පත්, පෙට්‍රල්/ඩීසල් බෙදාහැරීමේ නියෝජිකත්ව අයදුම්පත, ස්ථානය .............. ලෙස සඳහන් කරන ලද කවරයක මුද්‍රා තබා භාරදීම හෝ පහත දක්වනු ලබන ලිපිනයට 2019.10.10 දින ප.ව. 5.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතුයි.

ජ්‍යෙෂ්ඨ උප සභාපති (අලෙවි)
ලංකා ඉන්දියන් ඔයිල් සමාගම
20 වන මහල, බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
එචලොන් චතුරස්‍රය, කොළඹ 01.

# අයදුම් පත්‍රය ඇමුණුම "අ"

.............................. ඉන්ධන පිරවුම්හල් බෙදුම්කාරිත්වය සඳහා අයදුම්පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| 01. | නම | | | Photo |
| 02. | හවුල් ව්‍යාපාරයක් වන අවස්ථාවක අනෙකුත් අයදුම්කරුවන්ගේ නම් | | | |
| 03. | ලිපිනය | | | |
| 04. | විද්‍යුත් තැපැල | | | |
| 05. | දුරකථන | | ජංගම | |
| 06. | ජාතිය | | ජා.හැ.අංක | |
| 07. | උපන් දිනය | | | |
| 08. | අධ්‍යාපන සුදුසුකම් | | | |
| 09. | ඉඩම පිහිටි ස්ථානය | | | |
| 10. | නගරය | | දිස්ත්‍රික්කය | |
| a | ඉඩමේ මුහුණතෙහි දිග / අඩි | | ඉඩමේ පළල අඩි | |
| b | ඉඩම් හිමිකරුගේ / බදුකරුගේ නම<br>පිරවුම්හල ආරම්භ කිරීමට තෝරාගෙන ඇති ඉඩම ඔබේ නොවේ නම් නියම අයිතිකරුගෙන් කැමැත්ත ප්‍රකාශ කරගත් ලිපිය හෝ බදු ඔප්පුව | | | |
| 11 | අයදුම්පත්‍ර යොමු කිරීම අපේක්ෂිත ස්ථානයෙහි අනු අංකය | | | |

| | | | | |
|---|---|---|---|---|
| | මම / අපි ඉහත සපයන ලද තොරතුරු මාගේ/ අපගේ දැනීම අනුව හා විශ්වාසය අනුව සත්‍ය බවත් අප/මම කිසිදු අපරාධ වරදකට වරදකරු කරනු ලැබූ පුද්ගලයෙකු නොවන බවත් සහතික කරමි.<br>මම / අපි වැරදි තොරතුරු හෝ / කරුණු වරදවා දැක්වීම මාගේ අපගේ නියෝජිතභාවයට සලකා බැලීමට නුසුදුසු තත්වයට පත්වන බව සම්පූර්ණයෙන්ම වටහා ගනිමි / ගනිමු. | | | |
| | ස්ථානය | | දිනය | |

.............................................

අයදුම්කරුගේ අත්සන

# භාරදිය යුතු ලේඛණ පිරික්සුම් ලැයිස්තුව - ඇමුණුම "ආ"

| අනු අංකය | ලියවිල්ලේ ස්වභාවය | ඉදිරිපත් කර ඇත / නැත/ අදාල නොවේ |
|---|---|---|
| 1 | අත්සන සහිත සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය සමග ඡායාරූපය<br>(ඡායාරූපය මත අයදුම්කරු අත්සන් කල යුතුය.) | |
| 2. | සාමදාන විනිශ්චයකරුවෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු ඉදිරිපිටදී රු.25/-ක් වටිනා මුද්දරයක් මත අත්සන් කරන ලද පුවත්පත් දැන්වීමේ "ඇ" ලෙස අමුණා ඇති දිවුරුම් ප්‍රකාශය | |
| 3. | ශ්‍රී ලාංකිකයෙකු බවට සහතික කිරීමට අදාල ලියවිලිවල සහතික කල පිටපත් | |
| 4. | වයස සනාථ කිරීමට අවශ්‍ය ලියවිලි වල සහතික කල පිටපත් | |
| 5. | අධ්‍යාපන සුදුසුකම් සඳහා අදාල ලියවිලි වල සහතික කල පිටපත් | |
| 6. | ඉඩමේ හිමිකම් ඔප්පුවේ පිටපත | |
| 7. | පලාත්පාලන ආයතනය විසින් අනුමත කරන ලද ඉඩමේ මිනින්දෝරු සැලැස්මේ පිටපත | |
| 8. | විධිරේඛා සහතිකයේ පිටපත | |
| 9. | අයදුම්කරුට අයත් නොවන ඉඩමක් සම්බන්ධ අවස්ථාවේදී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශ කරනු ලබන ලිපිය | |
| 10. | ඉඩම අයදුම්කරුට අයත් නොවන අවස්ථාවේදී අයදුම්කරු හා ඉඩම් හිමියන් අතර ඥාති සම්බන්ධතාවය සනාථ කිරීමේ ලේඛණ | |
| 11. | හවුල් අයිතියක් වනවිටදී අනෙකුත් ඉඩම් හිමියන්ගෙන් ලබාගත් කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලේඛණ | |
| 12. | සවිස්තරාත්මක ව්‍යාපාර සැලැස්ම - බෙදා හැරීමේ නියෝජිත භාවය | |
| 13. | (අ). සීමාසහිත සමාගම් සමාගම්/ සමුපකාර සමිති සඳහා අයදුම් කිරීමේදී ඒ සඳහා බලය පැවරෙන ලිපි / බලය පවරන පුද්ගලයාගේ නම<br>(ආ). සීමාසහිත සමාගම් / සමුපකාර සමිති සඳහා නිසි අධිකාරිය විසින් නිකුත් කල ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කළ පිටපත<br>(ඇ). සීමාසහිත සමාගම් හා සමුපකාර සමිති සඳහා පවත්නා මූල්‍යමය වසර තුනක් සඳහා විගණනය කරන ලද ලාභ අලාභ ගිණුම් ප්‍රකාශ | |
| 14. | යාබද බිම් කොටස් පෙන්නුම් කරන අදාල ඉඩමේ කටු සටහන | |
| 15. | මූල්‍යමය හැකියාව පෙන්නුම් කරනු ලැබීමට අදාල ලේඛණ<br>(අ). රජයේ අනුමත තක්සේරුකරුවෙකු විසින් නිකුත් කරන ලද අදාල දේපල සඳහා වන තක්සේරු වාර්තාව<br>(ආ). ස්ථාවර තැන්පතු/ ඉතිරි කිරීමේ ගිණුම් අනෙකුත් දේ සම්බන්ධ විස්තර<br>(ඇ) පසුගිය මුදල් වර්ෂයේ දළ ආදායම සනාථ කිරීමට අවශ්‍ය ලියවිලි | |
| 16. | වෙනත් ලියවිලි | |
| | අමුණන ලද සමස්ථ පිටු ගණන | |

දිනය :______________ අයදුම්කරුගේ අත්සන ____________________

# දිවුරුම් ප්‍රකාශයයි - ඇමුණුම "ඇ"

.......................................හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක.................................විදේශ ගමන් බලපත්‍ර හිමි........................................ වන මට ගාම්භිරතා පූර්වකවද, අවංකවද, සත්‍ය ලෙසද, පහත දැක්වෙන පරිදි ප්‍රකාශ කර සිටිමි.

01. මෙහි ඉහත නම සඳහන් දිවුරුම් ප්‍රකාශක මම වෙමි.

02. මාගේ වයස ..................... බව ප්‍රකාශ කර සිටිමි.

03. ............................... දිනැති ........................ පුවත්පතෙහි පළකරන ලද දැන්වීම ප්‍රකාරව මා විසින් ලංකා IOC සමාගමේ බෙදාහැරීමේ නියෝජිතයෙකු ලෙස ඉන්ධන හළක් පවත්වාගෙන යාමට මා විසින් අයදුම් කර ඇති බව ප්‍රකාශ කර සිටිමි.

04. කිසිදු අපරාධ වරදකට මා දඬුවම් ලබා නොමැති අතර කිසිදු අපරාධ වරදක් මා විත්තිකරු ලෙස නම් කරන ලද නීති කටයුත්තක් හෝ කිසිදු නෛතික ක්‍රියාපටිපාටියක් මා නමින් අධිකරණයේ ක්‍රියාත්මක නොවන බව මම ප්‍රකාශ කර සිටිමි.

05. මා විසින් ඉන්ධන හළ පවත්වාගෙන යාමට අපේක්ෂා කරන ඉඩම .............................. දිස්ත්‍රික්කයේ ........................... හි ....................................... දරණ ඉඩම බලයක් මිනින්දෝරු ...................................... විසින් මැන සාදන ලද ................................ දිනැති සැළැස්ම ප්‍රකාරව ......................................විශාල ඉඩමේ හිමිකරු මම වන බව ප්‍රකාශ කර සිටිමි.

(මෙම ඉඩම අයදුම්කරුට අයත් නොවන අවස්ථාවකදී පහත සඳහන් ජේදය 5 වන ජේදයට ඇතුළත් වියයුතුය).

මා විසින් ඉහත ප්‍රකාශ කරන ලද ඉන්ධන හළ පවත්වාගෙන යාමට අපේක්ෂිත ...................................................... දිස්ත්‍රික්කයේ ...........................................පිහිටි ....................................(ඉඩමේ නම) ඉඩමට බලයලත් මිනින්දෝරුගේ අංක ..................... දරණ හා ......... .................... දිනැති පිඹුර ප්‍රකාර වෙන් කරන ලද ........................... අංක දරණ .................................ක් විශාල ඉඩම හා ඊට අයිති සියලු දේ .............................. (අයිතිකරු) මහතාගේ ඉහත සඳහන් අරමුණ උදෙසා මා විසින් කුලියට බද්දට ලබාගන්නා ලද්දක් බව ප්‍රකාශ කර සිටිමි.

ඉහත සඳහන් ප්‍රකාශය ප්‍රකාශකරුට කියවා)
තේරුම් කර දීමෙන් පසුව තේරුම් ගෙන )
වර්ෂ 20 ක්වූ මස ) මා ඉදිරිපිටදීය
වන දින දී අත්සන් තබන ලදී )

දිවුරුම් කොමසාරිස් / සාමදාන විනිශ්චයකරු